# නර්තනය පිළිබඳ (දෙවර්ෂ) පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව

# හා

# සංගීතය පිළිබඳ (දෙවර්ෂ) පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව

# 2023/ 2024 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම (සිංහල මාධ්‍ය)

ටවර් හෝල් රඟහල පදනම මගින් සිංහල මාධ්‍යයෙන් නර්තනය පිළිබඳ (දෙවර්ෂ) පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් හා සංගීතය පිළිබඳ (දෙවර්ෂ) පූර්ණකාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා 2023/2024 අධ්‍යයන වර්ෂයට නවක සිසුන් බඳවා ගනු ලැබේ.

මෙම දෙවර්ෂ පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව (SLQF3 හා 4) සම්පූර්ණ කරන සිසුන් (SLQF 5 හා 6) මට්ටමේ උපාධිය සඳහා යොමු කෙරේ.

**නර්තනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම්**

- අ.පො.ස (සා. පෙළ) නර්තනය විෂය ඇතුලුව විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව ගණිතය ඇතුලු විෂයයන් 06 කින් සමත්ව තිබීම. (මෙම සුදුසුකම් එක් සහතික පතකින් ඉදිරිපත් කළ හැකි විය යුතුය.)
- අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී නර්තනය විෂය ඇතුලුව විෂයයන් 03 එකවර සමත්ව තිබීම.

**සංගීතය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම්**

- අ.පො.ස (සා. පෙළ) සංගීතය විෂය ඇතුලුව විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව ගණිතය ඇතුලු විෂයයන් 06 කින් සමත්ව තිබීම. (මෙම සුදුසුකම් එක් සහතික පතකින් ඉදිරිපත් කළ හැකි විය යුතුය.)
- අ.පො.ස (උ. පෙළ) විභාගයේදී සංගීතය විෂය ඇතුලුව විෂයයන් 03 එකවර සමත්ව තිබීම.

  සියලු අයදුම්කරුවන් 2023.06.09 වන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 23 ට නොවැඩි අය විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

සුදුසුකම් සපුරා ඇති සියලු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර, එහිදී ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් වැඩිම ලකුණු ලබාගන්නා 60 දෙනෙකු බැගින් පාඨමාලා දෙක සඳහා තෝරා ගනු ලැබේ.

**පාඨමාලා ගාස්තුව :**

**සම්පූර්ණ පාඨමාලාව ගාස්තුව රු. 130,000/= කි. (මෙම මුදල වාරික වශයෙන් ගෙවීමේ පහසුකම් සළසා ඇත.)**

**අයදුම්පත හා වැඩි විස්තර www.towerhall.lk/si වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක.**

ටවර් හෝල් රඟහල පදනම වෙබ් අඩවියට පිවිස බාගත කර ගන්නා ලද අයදුම්පත නිසි ලෙස පුරවා අයදුම්පත් ගාස්තුව වන රු. 2,000/= ක් ලංකා බැංකුවේ හයිඩ්පාර්ක් ශාඛාවේ ගිණුම් අංක 2327541 වෙත ටවර් හෝල් රඟහල පදනම නමින් බැරකරන ලද ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ අලවා එවීමට කටයුතු කළ යුතුවේ. ලදුපත නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් 2023 ජූනි 09 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම, අංක 123, සච්සිරිපාය, විජේරාම මාවත, කොළඹ 07 ලිපිනයට යොමු කළ යුතුය. මීට අදාළව තවදුරටත් විස්තර අවශ්‍ය වන්නේ නම් 0112682134 මගින් පාඨමාලා අංශය / 0769193796 මගින් මංගලී, 0718443693 මගින් ලක්මිණී ඇමතීමෙන් ලබාගත හැක.

**අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම,**
**අංක 123, සච්සිරිපාය, විජේරාම මාවත, කොළඹ 07.**

## ටවර් හෝල් රඟහල පදනම

## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය